
勞工處
Labour Department
(Sinhala version)



## සියලුම සේවා යෝජකයන් සේවකයින්ගේ වන්දි රක්ෂණය (Employees' Compensation Insurance – ECI) ලබා ගත යුතුය, එසේ නොවුණහොත් විශාල ගැටළු වලට මුහුණ දීමට සිදුවනු ඇත.



හොංකොං නීති
යටතේ

ECI
ලබාගත යුතුමය

සියලුම සේවා යෝජකයින්

සේවකයෙකු සේවයේ යොදවා ගන්නා විට

ඕනෑම

සේවායෝජකයාගේ

- රැකියා ස්වභාව
- පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන රැකියාවක්ද යන වගය
- ස්ථිර හෝ තාවකාලික තත්ත්වය
- වැඩ කරන පැය ගණන
- රැකියා කොන්ත්‍රාත්තුවේ කාලසීමාව

නොසලකා



### තව දුරටත් දැනුවත් වීමට

හොංකොං නීති 282 පරිච්ඡේදය, සේවක වන්දි ආඥා පනතේ (Employees' Compensation Ordinance - ECO) 40 වැනි වගන්තිය යටතේ, රැකියා කොන්ත්‍රාත්තුවේ කාලසීමාව හෝ වැඩ කරන කාලය, පූර්ණ කාලීන හෝ අර්ධ-කාලීන රැකියාව, ස්ථිර හෝ තාවකාලික තත්ත්වය නොසලකා, සේවා යෝජකයාගේ වගකීම් ආවරණය කිරීම සඳහා නීතිය යටතේ (පොදු නීතියද ඇතුලත්ව), ECI හි ප්‍රතිපත්තියක් බලාත්මක වන්නේ නම් මිස, කිසිදු සේවා යෝජකයෙකු විසින් කිසිදු සේවකයෙකු කිසිදු රැකියාවක සේවයේ නොයෙදිය යුතුය.

# ECI ආවරණයක් ලබා ගැනීමට අපොහොසත් වීම දඩයකට සහ සිරගත කිරීමකට ලක්වියහැකි සාපරාධී වරදකි.

සේවකයෙකු සඳහා ECI ආවරණයක් ලබා ගැනීමට අපොහොසත් වන සේවා යෝජකයෙකු වරදක් සිදු කරන අතර :

සේවක වන්දි ආධාර අරමුදල් මණ්ඩලයට **අධිභාරයක්ද** ගෙවිය යුතුය.



වරදකරු ලෙස ඔප්පු වීම මත **ඩොලර් 100,000 ක උපරිම දඩයකට** සහ **වසර දෙකක සිර දඬුවමකට** යටත් වේ.

රැකියාවේදී අනතුරකට ලක්වූ හෝ මිය ගිය හෝ නිර්දේශිත වෘත්තීය රෝගයකින් පෙළෙන සේවකයා සඳහා වන නීති යටතේ **සේවකයින්ගේ වන්දි වගකීම්** දැරීමටද බැඳී සිටී.

## තව දුරටත් දැනුවත් වීමට


**ECI ආවරණයක් ලබා ගැනීමෙන් ECO සමග අනුකූල වීමට අපොහොසත් වන සේවා යෝජකයෙක්:**

- නඩු පැවරීමට සහ, වරදකරු ලෙස ඔප්පු වූ පසු, ඩොලර් 100,000 ක උපරිම දඩයකට සහ වසර දෙකක සිර දඬුවමකට යටත් වේ;
- හොංකොං නීතිවල 365 පරිච්ඡේදයේ සේවක වන්දි ආධාර ආඥාපනතේ 36A වගන්තිය යටතේ සේවක වන්දි ආධාර අරමුදල් මණ්ඩලයට අධිභාරයක් ගෙවීමට බැඳී සිටී; සහ
- ඔහු/ඇයගේ සේවකයා අනතුරකට ලක් වුවහොත් හෝ සේවා නියුක්තිය හේතුවෙන් හෝ එම කාලය තුළ හදිසි අනතුරකින් මිය ගියහොත් හෝ ECO යටතේ නිර්දේශිත වෘත්තීය රෝගයකින් පෙළෙන්නේ නම් හෝ නීති යටතේ (පොදු නීතියද ඇතුලත්ව) වන්දි වගකීම් දැරීමටද බැඳී සිටී.

# කිසිවිටක ව්‍යාජ රක්ෂණ ඔප්පුවක් භාවිතා නොකරන්න, එය බරපතල සාපරාධී වරදකි.

## පහත සඳහන් ක්‍රියාවන් නඩු පැවරිය හැකි බරපතල වැරදි වේ:

- ECI යටතේ ආවරණය වන සේවකයින් මවා පෑමේ අරමුණින් බහු රක්ෂණ ප්‍රතිපත්ති ව්‍යාජකරණය කිරීම සඳහා රක්ෂණ ඔප්පුවක් ප්‍රතිනිෂ්පාදනය කිරීම.
- වෙනත් පුද්ගලයෙකුගේ රක්ෂණ ඔප්පුවක් සොරකම් කිරීම හෝ අයථා ලෙස පරිහරණය කිරීම.
- රක්ෂණ ඔප්පුවක අන්තර්ගතය නීති විරෝධී ලෙස වෙනස් කිරීම.
- ව්‍යාජ රක්ෂණ ඔප්පුවක් හෝ ලේඛනයක් සෑදීම.



## තව දුරටත් දැනුවත් වීමට

සේවකයින් සඳහා ECI ලබා ගැනීමේ වගකීම රැවටීම සහ මග හැරීම සඳහා වන ඕනෑම චේතනාවක් පහත සඳහන් ආඥාපනත උල්ලංඝනය කිරීමක් විය හැකිය:

**(i)** අපරාධ ආඥාපනත (200 පරිච්ඡේදය):

- ▶ ව්‍යාජ ලේඛණ සෑදීම.
- ▶ ව්‍යාජ ලේඛනයක් සන්තකයේ තබා ගැනීම හෝ භාවිතය.
  (ව්‍යාජ ලේඛණ සෑදීම, ව්‍යාජ ලේඛනයක් සන්තකයේ තබා ගැනීම හෝ ව්‍යාජ ලේඛනයක් භාවිතය යන වැරදි සඳහා උපරිම දඬුවම වසර 14ක සිර දඬුවමකි.)

**(ii)** සොරකම් ආඥාපනත (210 පරිච්ඡේදය)

- ▶ වංචාව
  (වංචා කිරීමේ වරද සඳහා උපරිම දඬුවම වසර 14 ක සිරදඬුවමකි)

ඊට අමතරව, ඔහු/ඇයගේ සේවකයින් සඳහා / ECI ලබා ගැනීමට අපොහොසත් වන සේවා යෝජකයෙකු ECO යටතේ නඩු පැවරීමට යටත් වේ. උපරිම දඬුවම ඩොලර් 100,000 ක දඩයක් සහ වසර දෙකක සිර දඬුවමකි.

## සේවා යෝජකයන් නීතියට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව දැඩි බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනී.



කම්කරු
දෙපාර්තමේන්තුවේ
කාර්ය මණ්ඩලය



- ▶ සේවා ස්ථාන පරීක්ෂා කිරීම් සිදුකිරීම




- ▶ පරීක්ෂා කිරීම සඳහා වලංගු ECI ප්‍රතිපත්ති සහ අදාළ ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස සේවා යෝජකයන්ට ලිඛිතව ඉල්ලීම් කිරීම
- ▶ ECI ප්‍රතිපත්ති පිළිබඳව රක්ෂණ සමාගම් සමඟ විමසීම් කිරීම




## බලාත්මක කිරීමේ උදාහරණය 1

1




පලංචි වැඩබිමක් පරීක්ෂා කිරීමෙන් පසු, කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය ව්‍යාජ ECI ප් රතිපත්තියක් පිළිබඳ සැක සහිත සිද්ධියක් අනාවරණය කර ගනිති .

2




කම්කරු දෙපාර්තමේන්තුව විසින් මෙම නඩුව විමර්ශනය සඳහා පොලිසියට යොමු කරන ලදී.

3




අවසානයේදී, එක් පුද්ගලයෙක් අත්අඩංගුවට ගත් අතර, ව්‍යාජ නීත්‍යනුකූල ලේඛන සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් චෝදනා එල්ල කර පැය 120 ක ප්‍රජා සේවා නියෝගයකට ලක් කරන ලදී.


## බලාත්මක කිරීමේ උදාහරණය 2

1



රැකියාවේදී සිදුවූ හදිසි අනතුරක් හේතුවෙන් සේවකයෙකු තුවාල ලබා තිබුණි.

2




තුවාල ලැබූ සේවකයාගේ සේවායෝජකයා විසින් සේවකයා සඳහා ව්‍යවස්ථාපිතව අවශ්‍ය වන පරිදි ECI ලබා ගැනීමට අපොහොසත් වී ඇති බව විමර්ශනයෙන් පසුව කම්කරු දෙපාර්තමේන්තුව විසින් සොයා ගන්නා ලදී . මේ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව සේවායෝජකයාට එරෙහිව නඩු පැවරීය.


3



සේවකයා සඳහා ECI ලබා ගැනීමට අපොහොසත් වීමෙන් ECO උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සේවායෝජකයාට මාස හයක ක්ෂණික සිර දඬුවමක් නියම කරන ලදී.

* ඉහත සඳහන් උදාහරණ සත්‍ය සිදුවීම් වලින් ලබාගෙන ඇති අතර නිර්දේශය සඳහා පමණක් වේ.


# බලාත්මක කිරීමේ උදාහරණය 3



ප්‍රතිසංස්කරණ සිදුකරන සේවකයෙකු වැඩ කරමින් සිටියදී උසකින් වැටී තුවාල කිහිපයක් ලබා ඇත.



කම්කරු දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය කරන ලද අතර ECO විසින් නියමිත පරිදි ඔහු වෙනුවෙන් ECI ලබා ගැනීමට ඔහුගේ සේවායෝජකයා අපොහොසත් වී ඇති බව සොයා ගන්නා ලදී.



නිත්‍යානුකූලව ඔහුට වාරික ගෙවීමටද සේවායෝජකයා අසමත් වී ඇත.




සේවායෝජකයාට නඩු පවරා මාස දෙකක සිර දඬුවමකට ලක් කල අතර, මාස 18 කට අත්හිටුවා ඩොලර් 42,000 ක දඩයක් නියම කරන ලදී.

* ඉහත සඳහන් උදාහරණ සත්‍ය සිදුවීම් වලින් ලබාගෙන ඇති අතර නිර්දේශය සඳහා පමණක් වේ.



## "සේවකයින්" සහ "ස්වයං රැකියා නියුක්තිකයන්" අතර වෙනස හඳුනා ගන්න. වැරදි අවබෝධය ගැටළු වලට මග පෑදිය හැකිය.




**ECI**

අදාළ වන්නේ සේවකයින්ට පමණි.

**කොන්ත්‍රාත්කරුවන් හෝ ස්වයං**

රැකියා නියුක්තිකයන් ප්‍රමාණවත් පුද්ගලික හදිසි අනතුරු රක්ෂණ ප්‍රතිපත්ති ආවරණයක් තමන් විසින්ම ලබා ගැනීමට සලකා බැලිය යුතුය.

ඔහු/ඇයගේ සේවායෝජකයා ECI ලබා ගෙන නොමැති නම් හෝ වලංගු ECI ප්‍රතිපත්තියක් නොමැති බවට සැක කරන සේවකයෙකුට

- සේවායෝජකයාගෙන් ECI පිළිබඳ විස්තර ඉල්ලා සිටිය හැක.
- හැකි ඉක්මනින් කම්කරු දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතුය.

පැමිණිලි සඳහා ක්ෂණික ඇමතුම් අංකය:
**2815 2200**


## තව දුරටත් දැනුවත් වීමට

සේවකයෙකු සහ කොන්ත්‍රාත්කරුවෙකු හෝ ස්වයං රැකියා නියුක්තිකයෙකු අතර වෙනස හඳුනාගැනීමේදී අදාළ සියලු සාධක සැලකිල්ලට ගත යුතුය. ප්‍රධාන පොදු සාධක වලට,

- වැඩ පටිපාටි, වැඩ කරන වේලාවන් සහ ක්‍රමය කෙරෙහි ඇති පාලනය
- වැඩ උපකරණ, මෙවලම් සහ ද්‍රව්‍ය වල හිමිකාරිත්වය සහ සැපයීම
- එම පුද්ගලයා ආයෝජන සහ කළමනාකරණ වගකීම් සහිතව ඔහු/ඇයගේම ව්‍යාපාරයක් කරගෙන යනවාද යන වග
- එම පුද්ගලයා සේවා යෝජකයාගේ සංවිධානයේ කොටසක් ලෙස නිසි ආකාරයෙන් සලකනු ලබන්නේද යන වග
- එම පුද්ගලයාට කාර්යයට සහාය වීම සඳහා සහායකයින් බඳවා ගැනීමට නිදහස තිබේද යන්න
- ව්‍යාපාරය කෙරෙහි මූල්‍ය අවදානම් දැරීම (උදා: ලාභ අපේක්ෂාවක් හෝ අලාභ අවදානමක්)
- රක්ෂණ සහ බදු සම්බන්ධ වගකීම්
- අදාළ වෙළඳාමේ හෝ වෘත්තියේ සාම්ප්‍රදායික ව්‍යුහය සහ භාවිතයන්
- අධිකරණය අදාළ යැයි සලකන වෙනත් සාධක

සේවකයෙකු තම තත්ත්වය කොන්ත්‍රාත්කරුවෙකු හෝ ස්වයං රැකියා නියුක්තිකයෙකු ලෙස වෙනස් කිරීම ගැන සලකා බැලීමට පෙර, ඔහු/ඇය එවැනි වෙනසකදී ඔහුට/ඇයට අහිමි විය හැකි රැකියා අයිතිවාසිකම් සහ ප්‍රතිලාභ ඇතුළුව ඊට සම්බන්ධ වාසි සහ අවාසි ප්‍රවේශමෙන් තක්සේරු කළ යුතුය.

සේවකයා කොන්ත්‍රාත්කරුවෙකු හෝ ස්වයං රැකියා නියුක්තිකයෙකු ලෙස හැඳින්වුවද, හෝ කොන්ත්‍රාත්තුවේ ස්වයං රැකියාලාභියෙකු ලෙස නම් කර ඇතත්, හරය වශයෙන් සේවා යෝජකයා-සේවක සබඳතාවක් තිබේ නම්, අදාළ නීති සම්පාදනය යටතේ ස්වයං රැකියාවක නියුතු අයෙකු ලෙස ව්‍යාජ ලෙස ලේබල් කර ඇති සේවකයාට, ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ ආපසු ගෙවීමෙන් සේවායෝජකයා ඔහුගේ/ඇයගේ වගකීම් ඉටු කළ යුතුවේ. එපමණක් නොව, අදාළ නීති පද්ධතිය යටතේ සේවායෝජකයා සාපරාධී වගකීමකට යටත් විය හැකිය.



එක් එක් සිද්ධියේ සැබෑ තත්වයන් වෙනස් බැවින්, ආරවුලක් ඇති වූ විට අවසාන විවරණය අධිකරණය වෙත පැවරේ.

# අවදානම දරා ගැනීමට ප්‍රමාණවත් ECI ආවරණයක් ලබා ගන්න.




**ECI** ප්‍රතිපත්තිය

යනු සේවා යෝජකයෙකු සහ රක්ෂණ සමාගමක් අතර ඇතිකරගත් ලිඛිත ගිවිසුමකි.



**ECI** හි අරමුණ

වන්නේ රැකියාව හා සම්බන්ධ අනතුරු සහ මරණ වෙනුවෙන් සේවකයින්ගේ වන්දි ගෙවීමේදී **සේවා යෝජකයන්ගේ අවදානම** දරා ගැනීමයි.



## තව දුරටත් දැනුවත් වීමට

### සේවා යෝජකයන් ලබා ගන්නා ECI ආවරණ

| | ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන සේවකයින් ගණන | එක් සිද්ධියක් ආවරණය වන රක්ෂණ මුදල |
|---|---|---|
| සේවා යෝජකයන් ලබා ගත යුතු ECI | 200 නොඉක්මවන | ඩොලර් මිලියන 100 ට වඩා අඩු නොවන |
| | 200 ඉක්මවන | ඩොලර් මිලියන 200 ට වඩා අඩු නොවන |

### ECI ආවරණය ප්‍රධාන කොන්ත්‍රාත්කරුවෙකු විසින් ලබාගත් විටක

- ප්‍රධාන කොන්ත්‍රාත්කරුවෙක් කිසියම් ඉදිකිරීම් කටයුත්තක් සිදුකිරීමට භාරගෙන ඇති අවස්ථාවක, නීති යටතේ (පොදු නීතියද ඇතුළුව) ඔහු/ඇයට, ඔහු/ඇයගේ සහ ඔහු/ඇයගේ උප කොන්ත්‍රාත්කරු (කරුවන්) ගේ වගකීම් ආවරණය කිරීම සඳහා එක් අවස්ථාවකට ඩොලර් මිලියන 200 කට නොඅඩු මුදලකට රක්ෂණ ඔප්පුවක් ලබාගත හැක.
- වැඩවල ප්‍රධාන කොන්ත්‍රාත්කරු සහ ඔහු/ඇයගේ උප කොන්ත්‍රාත්කරු (කරුවන්) මේ සම්බන්ධයෙන් ලිඛිතව තම වගකීම් පැහැදිලිව නිර්වචනය කළ යුතුය.



# සාවද්‍ය ECI තොරතුරු සැපයීම විශාල වන්දි මුදලක් ඇරීමට හේතු වෙයි.



## සේවා යෝජකයන් සඳහා සටහන්

- වැඩ ආරම්භ කිරීමට පෙර සේවකයින් සඳහා ECI ලබා ගන්න.
- අවසර ලත් රක්ෂණ සමාගමක් හෝ බලපත්‍රලාභී රක්ෂණ අතරමැදියෙකු හරහා ECI ක්‍රියාවලිය සිදුකරගන්න.

## ECI ලබා ගැනීමේදී රක්ෂණ සමාගමට නිවැරදි තොරතුරු ලබා දීමට මතක තබා ගන්න.

ප්‍රතිපත්තියේ වලංගු කාලය තුළ රැකියා කොන්දේසි

- උදා: මුළු සේවක සංඛ්‍යාව , සැබෑ ඉපැයීම්, වෘත්තීන් සහ අදාළ විස්තර

ලේඛනමය සාක්ෂි

- උදා: සේවක වැටුප් වාර්තා/අනිවාර්ය අර්ථසාධක අරමුදල් දායක ප්‍රකාශන/බදු වාර්තා සහ ගිණුම් වාර්තා

**රක්ෂණ ඔප්පුව මගින් නිත්‍යානුකූලව සේවා යෝජකයාගේ වගකීම සම්පූර්ණයෙන්ම ආවරණය කළ හැකි බව තහවුරු කර ගැනීම සඳහා**

* සේවා යෝජකයන් සතුව කිසියම් වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග තිබේ නම්, ඔවුන් ඒවා රක්ෂණ සමාගම් වෙත වාර්තා කළ යුතුය, මෙය ඔවුන්ට අදාළ අවදානම් තක්සේරුව සහ ප්‍රතිරක්ෂණ සලකා බැලීමේදී සහාය විය හැක.



## ECI ලබා ගැනීමේදී සහ වලංගු කාල සීමාව තුළ නැතිනම් රක්ෂණ ඔප්පුව කල් ඉකුත් වන විට හෝ අවසන් කිරීමේදී, සේවා යෝජකයෙකු විසින් කළ යුතු දෑ:

- රක්ෂණ සමාගමට **අවශ්‍ය තොරතුරු** වාර්තා කිරීම ; සහ
- රක්ෂණ ඔප්පුවේ කල් ඉකුත්වන දිනය කෙරෙහි අවධානය යොමු කර එය කල් ඉකුත් වූ පසු **ආරක්ෂාව අහිමි වීම සහ නීතිය උල්ලංඝනය කිරීම වළක්වා ගැනීම සඳහා කල්තියා එය අලුත් කිරීමට** පියවර ගැනීම.



### තව දුරටත් දැනුවත් වීමට

- ECI ප්‍රතිපත්තිය යනු සේවා යෝජකයෙකු සහ රක්ෂණ සමාගමක් අතර ඇති කරගත් ලිඛිත ගිවිසුමකි. ECI හි ප්‍රධාන අරමුණ වන්නේ රැකියාව හා සම්බන්ධ අනතුරු සහ මරණ වෙනුවෙන් සේවකයින්ගේ වන්දි ගෙවීමේදී සේවා යෝජකයන්ගේ අවදානම බෙදා ගැනීමයි.

- බලයලත් රක්ෂණ සමාගම්වල සහ බලපත්‍රලාභී රක්ෂණ අතරමැදියන්ගේ ලැයිස්තුවට රක්ෂණ අධිකාරියේ වෙබ් අඩවිය හරහා පිවිසිය හැක.

- ECI ලබාගැනීමේදී, සේවා යෝජකයෙකු කළ යුත්තේ:
  - ✓ රක්ෂණ ඔප්පුවේ විස්තර හොඳින් පරීක්ෂා කර, යෝජනා පෝරමයේ සත්‍ය තොරතුරු සහ රක්ෂණ ඔප්පුහිමියාගේ පුද්ගලික අත්සන ලබා දීම ; සහ
  - ✓ රක්ෂණ ඔප්පුවෙහි ආවරණය අවබෝධ කර ගැනීම සඳහා එහි අන්තර්ගතය හොඳින් කියවීම.
- රැකියා තත්ත්වයන්හි කිසියම් සැලකිය යුතු වෙනසක් සිදු වුවහොත් (උදා: සේවක සංඛ්‍යා, සැබෑ ඉපැයීම්, සේවා ස්ථානය, රැකියා හෝ තනතුරු පිළිබඳ විස්තර) සේවායෝජකයා විසින් හැකි ඉක්මනින් රක්ෂණ සමාගමට දැනුම් දිය යුතුය.
- සේවායෝජකයාට යම් තොරතුරක් හෙළිදරව් කළ යුතුද යන්න පිළිබඳව ඔහු/ඇයට විශ්වාසයක් නොමැති නම්, හෝ ECI ලබා ගැනීම/ අලුත් කිරීම සඳහා කුමන තොරතුරු/ලේඛන රක්ෂණ සමාගම (හෝ රක්ෂණ අතරමැදියා) වෙත ඉදිරිපත් කළ යුතුද වැනි ECI ප්‍රතිපත්තියක් ලබා ගැනීම/ ප්‍රතිපත්ති නියමයන් පිළිබඳ ප්‍රශ්න තිබේ නම්, සේවායෝජකයාට රක්ෂණ සමාගමෙන් (හෝ රක්ෂණ අතරමැදියාගෙන්) සෘජුවම ඇසිය හැක.
- ECI ප්‍රතිපත්තිය ලබා ගැනීමේදී/අලුත් කිරීමේදී නිවැරදි තොරතුරු සහිතව කරුණු වාර්තා කිරීමට සේවායෝජකයා අපොහොසත් වුවහොත්, කිසියම් හිමිකම් පෑමකට වන්දි ගෙවීම සඳහා රක්ෂණකරු විසින් කලින් ගෙවූ මුදල් ආපසු අයකර ගැනීම සඳහා ප්‍රතිපත්තිය යටතේ ගන්නා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමකට සේවා යෝජකයා ලක්විය විය හැකිය.

# ECI මත වාරික වට්ටම් භුක්ති විඳීමට වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය (Occupational Safety and Health - OSH) ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

සේවා යෝජකයන්ට OSH වැඩිදියුණු කිරීමේ පියවර ක්‍රියාත්මක කළ හැකිය.

කාර්ය මණ්ඩලයට විවිධ උපකරණ සහ **පහසුකම් ලබා දීම සහ ඒවායේ නිසි භාවිතය සහතික කිරීම.**

**නිසි නඩත්තුව** සහතික කිරීම.

හදිසි අනතුරු නැවත ඇතිවීම වැලැක්වීම සඳහා රැකියා ආශ්‍රිත අනතුරුවලට හේතු වලක්වාගැනීම **වැඩිදියුණු** කිරීමේ ක්‍රියාමාර්ග සැකසීම සඳහා ආරක්ෂිත කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.

කාර්ය මණ්ඩලයට **සේවා** ආරක්ෂාව සම්බන්ධයෙන් තොරතුරු, උපදෙස්, පුහුණුව සහ අධීක්ෂණය සැපයීම

**ආරක්ෂිත ප්‍රමිතීන්ට අනුකූල** ප්‍රමාණවත් සහ සුදුසු **උපකරණ සහ අදාළ පහසුකම් ලබා ගැනීම.**



රක්ෂණ සමාගම් විසින් වාරික මත විශේෂ දීමනා ලබා දීම සලකා බැලිය හැක!

## තව දුරටත් දැනුවත් වීමට

### OSH ස්ටාර් ව්‍යවසාය - අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, වෙනස් කිරීම සහ එකතු කිරීමේ ආරක්ෂණ ප්‍රතීතන යෝජනා ක්‍රමය (OSH Star Enterprise - Repair, Maintenance, Alteration and Addition (RMAA) Safety Accreditation Scheme)

වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කවුන්සිලය (The Occupational Safety and Health Council - OSHC), කම්කරු දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් "OSH ස්ටාර් ව්‍යවසාය - RMAA ආරක්ෂිත ප්‍රතීතන යෝජනා ක්‍රමය" දියත් කර ඇත්තේ රක්ෂණ අංශයට ආරක්ෂාව පිළිබඳ දැනුවත් RMAA හිමිකරුවන්/කොන්ත්‍රාත්කරුවන් හඳුනා ගැනීම සඳහාය. මෙමගින් සුදුසුකම් ලත් ව්‍යවසායන් සඳහා සේවක වන්දි රක්ෂණ අවශේෂ යෝජනා ක්‍රමය යටතේ ECI ලබා ගැනීමේදී හිතකර වාරික අනුපාතයක් ලබාදීම සලකා බලනු ලැබේ. වාරික වට්ටම් 50% තරම් ඉහළ විය හැක.

### OSH ස්ටාර් ප්‍රතිචක්‍රීකරණ ව්‍යවසාය - ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තයේ ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ යෝජනා ක්‍රමය (OSH Star Recycling Enterprise - Recycling Industry Safety and Health Enhancement Scheme)

(The Occupational Safety and Health Council - OSHC) විසින් කර්මාන්තයේ වඩාත් හොඳ ප්‍රතිචක්‍රීකරණ සේවා ආරක්ෂණ ප්‍රමිතීන් සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා "OSH ස්ටාර් ප්‍රතිචක්‍රීකරණ ව්‍යවසාය - ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ යෝජනා ක්‍රමය" දියත් කර ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ OSH ස්ටාර් ලබා ඇති සේවා යෝජකයන්ට ප්‍රතිචක්‍රීකරණ අරමුදලෙන් ECI වාරික වට්ටම් (වසර දෙකක් දක්වා) දක්වා පිරිනමයි. එම වට්ටම් වාර්ෂික ECI වාරිකයෙන් 60%ක් තරම් ඉහළ අගයක් විය හැකි අතර, එය වසරකට ඩොලර් 70,000 ක සීමාවකට යටත්ව පවතී .


සේවා යෝජකයන්ට මෙම යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීමට අවශ්‍ය නම් (දුරකථනය: 2739 9377/ විද්‍යුත් තැපැල: oshc@oshc.org.hk) හරහා OSHC සම්බන්ධ කර ගත හැක.

# ECI ලබා ගැනීමේදී දුෂ්කරතා තිබේ නම් කුමක් කළ යුතුද?

හොංකොං හි රක්ෂණ කර්මාන්තය ECI ලබා ගැනීමේ දුෂ්කරතා ඇති සේවා යෝජකයන්ට සහාය වීම සඳහා අවසාන විසඳුමේ වෙළඳපොළක් ලෙස සේවක වන්දි රක්ෂණ අවශේෂ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.



**සේවා යෝජකයන්ට ECI ලබා ගැනීමට හැකි බව සහතික කිරීම සඳහා**



## තව දුරටත් දැනුවත් වීමට

ECI ලබා ගැනීමේ දුෂ්කරතා ඇති සේවා යෝජකයන්ට සීමාසහිත සේවක වන්දි රක්ෂණ අවශේෂ යෝජනා ක්‍රමය පිලිබඳ කාර්යාංශය හා සම්බන්ධ විය හැකිය. දුරකථනය (2591 9316/ විද්‍යුත් තැපැල: administrator@ecirsb.com.hk)

## රක්ෂණ ඔප්පුවක් පරීක්ෂා කරන්නේ කෙසේදැයි අධ්‍යයනය කරන්න. ECI ගැන බුද්ධිමත් වන්න.

ECI ප්‍රතිපත්තියක් පරීක්ෂා කිරීමේදී, **සියලුම සේවකයින් ප්‍රතිපත්තියෙන් ආවරණය වන බවට** වග බලා ගන්න සහ **පහත විස්තර කෙරෙහි අවධානය යොමු කරන්න.**

- ප්‍රතිපත්ති වර්ගය ECI ලෙස දැක්විය යුතුය
- රක්ෂිත සමාගමේ නම
- රක්ෂණ ඔප්පුවේ වලංගු කාලය
- වැඩ වල ස්වභාවය සහ/හෝ ව්‍යාපාරය
- ආවරණය වන සේවා ප්‍රදේශ/ස්ථාන (අදාළ නම්)
- සේවකයින්ගේ සැබෑ ඉපැයීම්
- රක්ෂණය කර ඇති සේවකයින් සංඛ්‍යාව
- ආවරණය වන වෘත්තීන්
- බැහැර කිරීම්
- වගකීම් සහතිකය



# සීමාසහිත XX රක්ෂණ සමාගම
## උප ලේඛනය

| | |
|---|---|
| **ප්‍රතිපත්ති අංකය.** | : CBDDAS/18/1 |
| **දිනය** | : 15ජනවාරි 2021 |
| **රක්ෂණ වර්ගය** | : සේවක වන්දි රක්ෂණය |
| **රක්ෂිත නම** | **: සීමාසහිත XX වෙළඳ සමාගම** |
| **රක්ෂණ කාලය** | : 1 පෙබරවාරි 2021 සිට 31 ජනවාරි 2022 |
| **ව්‍යාපාරය** | : වෙළඳ කටයුතු |
| **රැකියා ස්ථානය** | : 1) **21/F, ECI ගොඩනැගිල්ල, හොංකොං**<br>2) හොංකොං තුළ ඕනෑම තැනක |
| **වගකීම් සීමාව** | : එක් හිමිකම් පෑමකට හෝ එක් සිදුවීමකින් පැන නගින හිමිකම් මාලාවක් වෙනුවෙන් HK$ 100 මිලියනයක් |


**රක්ෂිත සේවකයින්**

| : සේවකයින්ගේ විස්තරය | සේවක සංඛ්‍යාව | සේවක වැටුප් ලැයිස්තුව |
|---|---|---|
| අධ්‍යක්ෂක | 2 | HK$967,200.00 |
| කළමනාකරු | 2 | HK$561,600.00 |
| සහකාර | 1 | HK$249,600.00 |
| ව්‍යාපාර සහකරු (කාය නොවන වැඩ) | 1 | HK$400,000.00 |

**තත්ත්වය සහ වගකීම්**

: 1) අසාමාන්‍ය කාලගුණ වගන්තිය
2) ආහාර සහ දිවා ආහාර විවේක කාල වගන්තිය

වෙනුවෙන් සහ උදෙසා
සීමාසහිත XX රක්ෂණ සමාගම






* ECI ප්‍රතිපත්ති උප ලේඛනය නිර්දේශය සඳහා පමණි. ඕනෑම සමානකමක් සම්පූර්ණ අහම්බයකි.

## තව දුරටත් දැනුවත් වීමට

- සේවා යෝජකයින් විසින් අදාළ රක්ෂණ ප්‍රතිපත්ති මගින් සපයනු ලබන ආවරණයේ සහ ආරක්ෂාවේ විෂය පථය මෙන්ම රක්ෂණ සමාගම් විසින් එයට අනුයුක්ත කළ හැකි කොන්දේසි කෙරෙහි අවධානය යොමු කළ යුතුය;
- ECI ප්‍රතිපත්ති හෝ ප්‍රතිපත්ති නියමයන් ලබා ගැනීම පිළිබඳ ඕනෑම විමසීමක් සඳහා කරුණාකර ඔබේ රක්ෂණ සමාගම් (හෝ රක්ෂණ අතරමැදියන්) වෙත යොමු වන්න;
- ඉදිකිරීම් කටයුතු සම්බන්ධ නම්,
  - ✓ රක්‍ෂණ ඔප්පුවේ ඇති රක්‍ෂිත සමාගමේ නම වැඩ භාරගන්නාගේ නමට සමාන විය යුතුය (එසේ නොවේ නම්, සමාගම් දෙක අතර ඇති සම්බන්ධය කුමක්ද සහ එම වැඩ භාර ගන්නා සමාගමේ සේවකයන් ආවරණය වන්නේද);
  - ✓ සේවා කාලය රක්ෂණ ඔප්පුවේ වලංගු කාලය තුළ අන්තර්ගත විය යුතුය; සහ
  - ✓ හිමිකරුවන්/දේපල කළමනාකරණ සමාගම් වලංගු ECI ප්‍රතිපත්ති සහිත කොන්ත්‍රාත්කරුවන්ගේ/සමාගම්වල සේවාවන් භාවිතා කළ යුතුය. වැඩ ආරම්භ කිරීමට පෙර, අයිතිකරුවන්ට/දේපල කළමනාකරණ සමාගම්වලට හදිසි අනතුරකදී ඇරිය යුතු වන්දි මුදල අවම කිරීම සඳහා වලංගු ECI සහ තෙවන පාර්ශවීය රක්ෂණ ඔප්පු ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරුවන්/සමාගම්වලින් ඉල්ලා සිටිය හැක.



## සේවකයින්ගේ වන්දි (Employees’ Compensation - EC) ආරවුල් විසඳා ගන්නේ නඩු පැවරීමෙන්ද නැතිනම් මැදිහත් වීමෙන්ද?

කම්කරු දෙපාර්තමේන්තුව ඊකියාවෙන් සිදු වූ අනතුරු හෝ නිර්දේශිත වෘත්තීය රෝග වලින් පෙළෙන සේවකයින්ට ECO යටතේ වන්දි ලබා ගැනීම සඳහා සහාය වේ.



ආරවුලක් ඇති අවස්ථාවක



කම්කරු දෙපාර්තමේන්තුව විසින් EC ආරවුල් විසඳීම සඳහා සේවායෝජකයාට සහ සේවකයාට සහාය ලබා දිය හැකිය.



සේවායෝජකයාට සහ සේවකයාට කිසිදු විසඳුමක් ලබා ගත නොහැකි නම්, නඩුව අධිකරණය විසින් තීරණය කරනු ලැබේ.

### තව දුරටත් දැනුවත් වීමට

EC ආරවුල් හැසිරවීමේදී ඒ ඒ නඩුවේ තත්වයන් මත පදනම්ව අදාළ තොරතුරු සහ වෛද්‍ය වාර්තා එකතු කිරීම වැනි දෑ සඳහා කාලය ගතවේ. EC නඩුවක් හෝ EC නඩුවකින් පැන නගින/ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් විනිශ්චය කිරීමට ECO විසින් කම්කරු දෙපාර්තමේන්තුවට බලය ලබා නොදේ. එබැවින්, සේවායෝජකයාට සහ සේවකයාට කම්කරු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව කිසියම් බේරුම් ගිවිසුමකට එළඹිය නොහැකි නම්, EC ආරවුල අධිකරණය විසින් තීරණය කරනු ඇත.

ECO ක්‍රියා පටිපාටි ආරම්භ කිරීමෙන් පසු, සේවායෝජකයා සහ සේවකයා EC ආරවුල් විසඳීම සඳහා විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රම අනුගමනය කිරීමට කැමති නම්, කාලය සහ නීතිමය වියදම් ඉතිරි කර ගැනීම සඳහා ආරවුල විසඳීමට ඔවුන්ට මැදිහත් වීමට උත්සාහ කළ හැකි අතර එමඟින් අධිකරණයෙන් පැන නගින නඩු අවදානම වළක්වා ගත හැකිය. වෘත්තීය මැදිහත්කරුවන් විසින් ආරවුල් ඇති ගැටළු හඳුනා ගැනීමට, විකල්ප ගවේෂණය කිරීමට, එකිනෙකා සමඟ සන්නිවේදනය කිරීමට සහ ආරවුල විසඳීම සම්බන්ධයෙන් එකඟතාවකට පැමිණීම සඳහා ක්‍රියා පටිපාටි, ආරවුල සම්බන්ධයෙන් විනිශ්චය කිරීමකින් තොරව පාර්ශවයන්ට සහාය වනු ඇත. එපමනක් නොව, මැදිහත්වීම රහසිගත ක්‍රියාවලියක් වන අතර මැදිහත්වීමේ සැසියකදී සන්නිවේදනය කරන සියලුම තොරතුරු කැමැත්තෙන් හෝ නීතියෙන් අවශ්‍ය නම් මිස කිසිඳු තෙවන පාර්ශවයකට හෙළිදරව් නොකෙරේ.

මැදිහත් සමාධානය පිළිබඳ වැඩිදුර දැන ගැනීමට, කරුණාකර අධිකරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ "නීති සහ ආරවුල් විසඳීමේ සේවා" වෙබ් පිටුවට පිවිසෙන්න.
:(www.doj.gov.hk/en/legal_dispute/mediation.html).

# විමසීම්/වාර්තා

ECI ප්‍රතිපත්ති හෝ ප්‍රතිපත්ති නියමයන් ලබා ගැනීම පිළිබඳ ඕනෑම විමසීමක් සඳහා කරුණාකර ඔබේ රක්ෂණ සමාගම් (හෝ රක්ෂණ අතරමැදියන්) වෙත යොමු වන්න. මෙම පත්‍රිකාවේ අන්තර්ගතය පිළිබඳ වැඩිදුර තොරතුරු විමසීම් සඳහා කරුණාකර පහත ලැයිස්තුගත කර ඇති අදාළ දෙපාර්තමේන්තු(ව)/සංවිධාන(ය) අමතන්න.

**කම්කරු දෙපාර්තමේන්තුව (Labour Department)**
වෙබ් අඩවිය: www.labour.gov.hk
විමසීම් ක්ෂණික ඇමතුම් අංකය: 2717 1771 (“1823" විසින් හසුරුවනු ලැබේ.)

**ව්‍යවස්ථාපිත ECI අවශ්‍යතා සමඟ සේවා යෝජකයන්ගේ අනුගත නොවීම වාර්තා කිරීම සඳහා පැමිණිලි ක්ෂණික ඇමතුම් අංකය: 2815 2200**
**අනාරක්ෂිත ක්‍රියාකාරකම් වාර්තා කිරීමට OSH පැමිණිලි ක්ෂණික ඇමතුම්*: 2542 2172**

**රක්ෂණ අධිකාරිය (Insurance Authority)**
වෙබ් අඩවිය: www.ia.org.hk
දුරකථන: 3899 9983

**හොංකොං රක්ෂණකරුවන්ගේ සම්මේලනය**
**(The Hong Kong Federation of Insurers)**
වෙබ් අඩවිය: www.hkfi.org.hk
දුරකථන: 2520 1868

**සීමාසහිත සේවක වන්දි රක්ෂණ අවශේෂ යෝජනා ක්‍රමය පිළිබඳ කාර්යාංශය (The Employees’ Compensation Insurance Residual Scheme Bureau Limited )**
වෙබ් අඩවිය: www.ecirsb.com.hk
දුරකථන: 2591 9316

**වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සභාව**
**(Occupational Safety and Health Council)**
වෙබ් අඩවිය: www.oshc.org.hk
Tel: 2739 9377

ECI ලබා ගැනීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර රක්ෂණ අධිකාරිය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම-නිෂ්පාදනය කරන ලද "සේවකයන්ගේ වන්දි රක්ෂණය ලබා ගැනීම පිළිබඳ වැඩිදුර දැන ගන්න" පත්‍රිකාව බලන්න.

* කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ හෝ GovHK (https://eform.one.gov.hk/form/ld0001/en/) හි ඇති OSH පැමිණිලි පෝරමය පිරවීමෙන් මහජනතාවට අනාරක්ෂිත OSH භාවිතයන් වාර්තා කළ හැකිය. (https://eform.one.gov.hk/form/ld0001/en/).

මෙම පත්‍රිකාවේ තොරතුරු මුද්‍රණය කරන අවස්ථාවට වලංගු වේ

©2021 කම්කරු දෙපාර්තමේන්තුව, HKSAR රජය
Old Master Q හිජායාරූප ©2021 OMQ ZMEDIA LTD.

2021 ජූනි

(Sinhala version)